මාධ්‍ය නිවේදන - අංක 96

මැතිවරණ කොමිෂන් සභාව

පාර්ලිමේන්තු මැතිවරණය - 2020.08.05

## 2020 පාර්ලිමේන්තු මැතිවරණය සඳහා තරග කරන ලද සියළුම අපේක්ෂකයන් වෙත කෙරෙන නිවේදනයයි

1988 අංක 74 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1975 අංක 01 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනතේ විධි විධාන අනුව පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් තේරී පත්වන අපේක්ෂකයන් ස්වකීය වත්කම් හා බැරකම් ප්‍රකාශ ඔහු හෝ ඇය නාමයෝජනා කරනු ලැබූ දිනයේ දී හෝ පාර්ලිමේන්තුවේ අසුන් ගැනීමට හෝ පාර්ලිමේන්තුවේ දී ඡන්දය පාවිච්චි කිරීමට පෙර පාර්ලිමේන්තු මන්ත්‍රී ධූරාපේක්ෂකයකු ලෙස තරග කළ දිස්ත්‍රික්කයේ තේරීම්භාර නිලධාරී හරහා හෝ සෘජුවම මැතිවරණ කොමිෂන් සභාව වෙත බාරදිය යුතු ය.

***එබැවින් නාම යෝජනා කාල සීමාවේ දී හෝ ඉන් පසුව ඡන්ද විමසීම් දිනයට පෙර ස්වකීය වත්කම් හා බැරකම් ප්‍රකාශ භාරදීමට අපොහොසත් වී ඇති සියළුම තේරී පත් වූ හෝ තෝරා යවන ලද මන්ත්‍රීවරුන් ස්වකීය වත්කම් හා බැරකම් ප්‍රකාශ වහාම ඒ ඒ තේරීම්භාර නිලධාරී හරහා හෝ සෘජුවම මැතිවරණ කොමිෂන් සභාව වෙත බාරදිය යුතු බව මෙයින් නිවේදනය කරනු ලැබේ.***

එමෙන්ම තේරී පත් නොවූ අපේක්ෂකයින් ස්වකීය වත්කම් හා බැරකම් ප්‍රකාශ මේ වනතෙක් බාර දී නොමැති නම් එම වත්කම් හා බැරකම් ප්‍රකාශ ඡන්ද විමසීමේ ප්‍රතිඵල නිකුත් කිරීමෙන් අනතුරුව තේරී පත් වූ මන්ත්‍රීවරුන් ප්‍රකාශයට පත්කළ 2020 අගෝස්තු මස 07 වන දින සිට මසක් ඉකුත්වීමට පෙර එනම්, 2020 සැප්තැම්බර් මස 06 දින හෝ එදිනට පෙර ඒ ඒ තේරීම්භාර නිලධාරී හරහා හෝ සෘජුවම මැතිවරණ කොමිෂන් සභාව වෙත ලබාදිය යුතු බව ද මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අයුරින් ස්වකීය වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා නොදෙන්නා වූ අපේක්ෂකයින් 1988 අංක 74 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1975 අංක 1 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනතේ විධි විධාන උල්ලංඝනය කිරීමේ වරද සිදුකරනු ලැබූ අයකු සේ සලකා ඔවුන් පිළිබඳව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත වාර්තා කරනු ලබන බව ද වැඩිදුරටත් දන්වා සිටිනු ලැබේ.

ඒ ඒ තේරීම්භාර නිලධාරී හරහා හෝ සෘජුවම මැතිවරණ කොමිෂන් සභාව වෙත බාරදෙනු ලබන මෙම වත්කම් හා බැරකම් ප්‍රකාශ අදාළ පනතේ විධි විධානවලට යටත්ව ඕනෑම පුරවැසියකුට ලබාගත හැකි නමුත් එම ප්‍රකාශ අධිකරණමය කාර්යයන් සඳහා නැතහොත් අධිකරණයකට ඉදිරිපත් කිරීම සඳහා හැර වෙනත් කිසිදු කාර්යයන් සඳහා භාවිතා කිරීමට නීතිමය ප්‍රතිපාදන නොමැති බව ද මෙයින් නිවේදනය කරනු ලැබේ.

එසේවුවත් සියළුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ඇතුළු ප්‍රමුඛ දේශපාලනඥයින් විසින් ස්වකීය වත්කම් හා බැරකම් ප්‍රකාශ, උනන්දුවක් දක්වන පාර්ශ්වවල දැනගැනීම සඳහා ස්වකීය වෙබ් අඩවි හරහා ප්‍රසිද්ධ කරන්නේ නම් එය යහපත් පාලන ක්‍රමයකට බෙහෙවින් උපකාරී වනු ඇති බව මැතිවරණ කොමිෂන් සභාව අදහස් කරයි.

මහින්ද දේශප්‍රිය
සභාපති, මැතිවරණ කොමිෂන් සභාව
මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙනි

මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත,
රාජගිරිය.

2020.08.~~10~~ 12.